සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# දෙවන වාර පරීක්ෂණය 2019
# පුරවැසි අධ්‍යාපනය

**06 ශ්‍රේණිය** **කාලය පැය 02 යි.**

නම/ විභාග අංකයඃ

## I - කොටස

- **ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න. මෙම පත්‍රය සඳහා ලකුණු 40 ක් හිමිවේ.**
- **01- 05 දක්වා ප්‍රශ්නවලට වඩාත් නිවැරදි පිළිතුර වරහන් තුළින් තෝරා හිස්තැන මත ලියා දක්වන්න.**

01. පාසලේ ඉතිහාසය දැන ගැනීමට ලොග් පොත මෙන්ම ...................................................... ගෙන් ද ලබාගන්නා තොරතුරු ද වැදගත් ය. (ශිෂ්‍යාවන් / දෙමාපියන් / විශ්‍රාමික විදුහල්පතිවරුන්)

02. පාසලක සංවිධාන ව්‍යුහය ගත්විට ආදි ශිෂ්‍ය සංගමය හා ........................................................... කමිටුවට ද වැදගත් තැනක් හිමිවේ. (පරිසර / පාසල් සංවර්ධන / සුබසාධක)

03. ඔබේ යුතුකමක් ලෙස පාසලේ පවතින ........................................................ තුළින් පාසලේ ගුණාත්මක බව වැඩි කර ගත යුතුය. (සම්පත් ආරක්ෂා කිරීම / පිරිසිදු බව / ක්‍රමවත් බව)

04. ආවේගශීලී බව හා ........................................................ ඔබේ අභියෝග ජය ගැනීමට බාධාවක් වේ. (නිර්මාණශීලී බව / අලස බව / විද්‍යුත් මාධ්‍ය භාවිතය)

05. ඔබේ දක්ෂතා ........................................................ පෙන්වීම මගින් ඔබේ දියුණුව සලසා ගත හැකිය. (නිරන්තරයෙන් / අවශ්‍ය වූ විට / අවස්ථානුකූලව)

- **අංක 06 - 10 දක්වා ප්‍රශ්නවල දැක්වෙන ප්‍රකාශ නිවැරදි නම් (✓) ලකුණ ද, වැරදි නම් (✗) ලකුණ ද ඉදිරියේ ඇති වරහන තුළ යොදන්න.**

06 දුර්වලතා අන් අය පෙන්වා දුන්විට ඒවා නිහතමානීව පිළිගැනීම සෑම දෙනෙකුම සතු හොඳ ලක්ෂණයකි. ( )

07 සෑම අභියෝගයක්ම ජීවිත සාර්ථකත්වයට තුඩුදෙන ශක්තියකි. ( )

08 පාසල තම දක්ෂතා ප්‍රදර්ශනයට අවස්ථා ලබාදෙන අතරම තනිව ක්‍රියාකිරීමට පුහුණු කරයි. ( )

09 යහපත් අරමුණු ඇතිකර ගැනීම සිසුන්ට මෙන්ම සමාජයේ ද ප්‍රගතියට හේතු වේ. ( )

10 පාසලේ සියලු දෙනාගේම අයිතිවාසිකම් මැනවින් ආරක්ෂා කිරීම සඳහා පාසලට සෑම දිනකම පැමිණිය යුතුය. ( )

- **අංක 11 - 15 දක්වා ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

11 පාසල් ගීතය මගින් ඉටුවන සුවිශේෂී මෙහෙය වන්නේ මින් කුමක් ද?

(1) පාසලට අභිමානයක් ඇතිවීම.

(2) පාසලෙන් ජාතියට සිදුවන මෙහෙය පිළිබඳ සිතුවිලි ජනිත වීම.

(3) වෙනත් කිසිඳු කාර්යයකට අවධානය යොමු නොකිරීම.

(4) සිරුවෙන් සිටිමට හුරු පුරුදු වීම.

12. පාසල අනාගතයේ දී ඉටුකර ගැනීමට බලාපොරොත්තු වන අරමුණ දක්වෙන්නේ මින් කුමකින් ද?

(1) මෙහෙවර (2) පාසල් ගීය (3) දැක්ම (4) පාසල් කොඩිය

13. පාසලේ සාමාජිකයෙකු ලෙස ඔබ ඉටුකළයුතු යුතුකමක් මේවායින් තෝරන්න.

(1) ආරක්ෂා සහිතව සිටීම.

(2) අධ්‍යාපනය ලැබීම.

(3) අදහස් ප්‍රකාශ කිරීම.

(4) සිසුන් සමග සමානාත්මතාවයෙන් යුතුව කටයුතු කිරීම.

14. මේවායින් සමාජයෙන් පාසලට සැපයෙන සේවාවක් වන්නේ කුමක් ද?

(1) මනා සෞඛ්‍යාරක්ෂිත ක්‍රම පිළිබඳව දැනුවත් කිරීම.

(2) විනය ගරුක පුද්ගලයින් බිහි කිරීම.

(3) දක්ෂතා එළිදක්වීමට අවස්ථා ලබාදීම.

(4) අනාගත නායකයන් පුහුණු කිරීම.

15. මොණරාගල, අම්පාර, පොළොන්නරුව යන දිස්ත්‍රික්ක අයත් වන පළාත් පිළිවෙලින් අඩංගු වන පිළිතුර තෝරන්න.

(1) වයඹ, මධ්‍යම, නැගෙනහිර (2) ඌව, නැගෙනහිර, උතුරුමැද

(3) සබරගමුව, දකුණ, නැගෙනහිර (4) උතුරුමැද, ඌව, මධ්‍යම

- **අංක 16 - 20 දක්වා ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර හිස්තැන මත ලියා දක්වන්න.**

16 ශ්‍රී ලංකාව පරිපාලන දිස්ත්‍රික්ක .................................................................... කින් සමන්විත ය.

17 බලශක්තිය නිපදවීම සඳහා සුළඟ, හිරුඑළිය මෙන්ම ..................................................... ද උපයෝගී කර ගනී.

18 යහපත් පරිසරයක් පවත්වාගෙන යාම සඳහා භෞතික සම්පත් කාර්යක්ෂම හා ............................................. යුතුව භාවිතා කළ යුතුය.

19 මිනිසාගේ ................................................. සහ කායික හැකියා වැඩි දියුණු කර ගැනීමෙන් මානව සම්පත් බිහිවෙයි.

20 මිනිසාගේ සාමූහික පැවැත්ම දියුණු ................................................................. ගොඩ නැගීමට හේතු වී තිබේ.

(ලකුණු 2 x 20 = 40)

## <u>II - කොටස</u>

- පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ.
- පළමු ප්‍රශ්නය සහ තවත් ප්‍රශ්න 04 ක් තෝරාගෙන ප්‍රශ්න 05 කට පිළිතුරු සපයන්න.

01



A



B




C

(1) මෙම පින්තූර ආශ්‍රිත කටයුතු තුළින් අප රටට වැඩදායී මානව සම්පත් 4 ක් නම් කරන්න. (ල. 04)

(2) එම මානව සම්පත් වලින් ලැබෙන ප්‍රයෝජන එක බැගින් දක්වන්න. (ල. 04)

(3) මානව සම්පත් විධිමත්ව පුහුණු කිරීම තුළින් ලැබෙන ප්‍රයෝජන අනුව පහත සටහන සම්පූර්ණ කරන්න. (ල. 04)

මානව සම්පත → (පුහුණුව) → හැකියාවන් වැඩිදියුණු වේ. → 1. .................................. සපුරාගනී.

↓

වෘත්තීය වශයෙන් 2. .................................. → 3. .................................. වාසි සැලසේ → 4. .................................. සිදුවේ.

(4) මෙහි දක්වා තිබෙන වගුව භාවිතාකොට භෞතික හා මානව සම්පත්වල තොරතුරු ඇසුරෙන් සම්පූර්ණ කරන්න.

| භෞතික සම්පත් | නිෂ්පාදන | මානව සම්පත් |
|---|---|---|
| මැටි | A .............................. | ගඩොල් කපන්නා |
| ජලය | ජල විදුලිය | B .............................. |
| ශාක | ද්‍රව භාණ්ඩ | C .............................. |
| මැණික් | D .............................. | රන්කරුවා |

(ල. 04)

02 (1) ඔබ පාසලේ සංවිධාන ව්‍යුහය පිළිබඳ සටහනක් පහත දක්වා ඇත. සුදුසු පරිදි එය සම්පූර්ණ කරන්න.

ශිෂ්‍ය / ශිෂ්‍යාවන්

↓

A ..................................

↓

ශිෂ්‍ය නායක / නායිකා

↓

B ..................................

↓

අංශ භාර ගුරුවරු / ගුරුවරියන්

↓

C..................................

↓

ආදිශිෂ්‍ය සංගමය ← D .................................. → E .................................. (ල. 05)

(2)

| | |
|---|---|
| A | හොඳින් අධ්‍යයන කටයුතුවල යෙදීම. |
| B | පාසල් භූමිය අලංකාරව හා පවිත්‍රව පවත්වාගෙන යාම. |
| C | අධ්‍යයන කටයුතුවල නියමුවා ලෙස කටයුතු කිරීම. |
| D | ඉගැන්වීම් කටයුතු අධීක්ෂණය කිරීම. |
| E | පාසලේ ආරක්ෂක කටයුතු සඳහා සහය දැක්වීම. |
| F | පාසල් මැණියගේ ගෞරවය ආරක්ෂා වන පරිදි සැමවිටම හැසිරීම. |

පාසලක සංවිධාන ව්‍යුහයේ දැක්වෙන තනතුරුවලට අදාළ කාර්යයන් කිහිපයක් ඉහත දක්වා ඇත. ඒවා නිවැරදිව හඳුනාගෙන නිවැරදි අක්ෂරය අදාළ තීරුවෙහි සටහන් කරන්න.

| විදුහල්පති | ශිෂ්‍ය / ශිෂ්‍යාවන් | අනධ්‍යයන කාර්ය මණ්ඩලය |
|---|---|---|
| | | |

(ල. 06)

03 (1) ජීව දත්ත තොරතුරු පත්‍රිකාවක ආකෘතිය මෙහි දක්වා ඇත. එහි 2, 4, 6, 8, 9 අංකවල හිස්තැන් සඳහා සම්පූර්ණ විය යුතු තොරතුරු යොදන්න.

**ජීව දත්ත තොරතුරු පත්‍රිකාව**

1. මුලකුරු සමග නම
2. ..............................................................
3. වයස
4. ..............................................................
5. දුරකථන අංකය
6. හදිසි අවස්ථාවකදී ..........................................
7. ඔබගේ පාසලේ නම
8. ..............................................................
9. ..............................................................
10. පාසලට ඇතුළත් වූ දිනය
11. පාසලේ සිට ඔබ පදිංචි ස්ථානයට ඇති දුර

.............................. ......................................

දිනය අත්සන

(ල. 05)

(2) පුද්ගලයකු සතු දක්ෂතා වැඩි දියුණු කරගත හැකි ක්‍රමවේද කිහිපයක් මෙහි දක්වා ඇත. ඒවා සම්පූර්ණ කරන්න.

හැකියා දක්ෂතා වැඩිදියුණු කර ගැනීමට හැකිය →

- තම ජීවිත 1. ................................................
- විවිධ පුහුණු 2. ................................................
- සුදුසු විද්‍යුත් 3. ................................................
- ප්‍රවීණයන්ගේ 4. ................................................
- පුවත්පත් මගින්
- අන් අයගේ අත්දැකීම් දැක 5. ................................................
- තම හැකියා අලලා ලියැවුණු 6. ................................................

(ල. 06)

04 (1) ඔබ ඇතැම් අවස්ථාවලදී සැලසුම් සහගත නොවී කටයුතු කරන විට ඇතිවන ගැටලු කිහිපයක් පහත දක්වා ඇත. ඒවා මඟහරවා ගැනීමට ගතයුතු ක්‍රියාමාර්ග වරහනින් තෝරා ලියන්න.

A වැඩ කල්දමයි.

B අත්‍යවශ්‍ය පියවර අත්හරී

C අභියෝගවලට මුහුණ දීමට අපහසු වෙයි

D දැඩි ආතතියෙන් යුතුව කටයුතුවල යෙදීම

E සහභාගි නොවීම නිසා පසුතැවීම

F වැඩවල අපිළිවෙල (ල. 06)

(සතුටින් වැඩ කිරීම / ක්‍රමානුකූලව වැඩ කිරීම / කලට වේලාවට වැඩ නිම කිරීමට හුරුවීම / දුර්වලතා හඳුනාගැනීම / ප්‍රධාන කාර්යයන් හඳුනාගැනීම / දක්ෂතා හඳුනාගෙන ඉදිරිපත් වීම)

(2)



A



B




C

i. ඉහත A, B, C පින්තූර ආශ්‍රිත ක්‍රියාකාරකම්වලදී ඔබ තුළ වර්ධනය වන යහපත් ගුණාංග එක බැගින් ලියන්න. (ල. 03)

ii. A හා C ක්‍රියාකාරකම්වල දී ඔබ හැසිරිය යුතු ආකාර එක බැගින් දක්වන්න. (ල. 02)

05 (1) ඔබ සැලසුමකට හා සංවිධානාත්මකව වැඩ කිරීම නිසා ඇතිවන වාසි කිහිපයක් මෙහි දක්වා ඇත. ඒවා නිවැරදිව සම්පූර්ණ කරන්න. (ල. 06)




(2) පන්තිකාමරය පවිත්‍රව තබාගැනීමට අවශ්‍ය වැඩසටහනක් සැලසුම් කිරීමට අදාළ කරුණු මෙහි අපිළිවෙළින් දක්වා ඇත. ඒවා පිළිවෙළින් සකස් කරන්න.

A යෝජනා ලබාගැනීම.

B අඩුපාඩු හඳුනාගැනීම හා සටහන් කර ගැනීම.

C පන්ති කාමරයේ ඇති දෑ හඳුනාගැනීම.

D වඩා ඉක්මනින් කළයුතුදේ තීරණය කිරීම.

E වැඩ සටහනක් සැකසීම. (ල. 05)

06 (1) ශ්‍රී ලංකාවේ පළාත් හා දිස්ත්‍රික්ක ඇසුරින් පහත සඳහන් වගුව සම්පූර්ණ කරන්න.

| පළාත | දිස්ත්‍රික්කය |
|---|---|
| 1. නැගෙනහිර | ........................................................ |
| 2. ........................................................ | පුත්තලම |
| 3. ඌව | ........................................................ |
| 4. ........................................................ | ගම්පහ |

(ල. 04)

(2) පහත සඳහන් ප්‍රධාන නගර අයත් වන්නේ කුමන පළාතටදැයි දක්වන්න.

1. මාතර - ..................................................
2. රත්නපුරය - ..................................................
3. මන්නාරම - .................................................. (ල. 03)

(3) ඔබ පළාතට අයත්වන දිස්ත්‍රික්ක දෙකෙහි පවතින භෞතික සම්පත් 2 බැගින් සඳහන් කරන්න. (ල. 04)

07 පහත දැක්වෙන උපකාරක පද උපයෝගී කර ගෙන ප්‍රහේලිකාව සම්පූර්ණ කරන්න.

<u>හරහට</u>

(2) පුද්ගල සංවර්ධනයට මෙන්ම සමාජ සංවර්ධනයට දායකවන ආයතනයකි.

(3) මෙම ස්ථාන නැවත ගොඩකිරීමෙන් නායයෑමේ අවදානම අවම කරගත හැකිය.

(5) දැව වෙනුවට භාවිතා කරන විකල්ප ක්‍රමයකි.

(7) සබරගමු පළාතට අයත් දිස්ත්‍රික්කයකි.

(9) සැලසුමකට අනුව වැඩ කිරීමෙන් මෙය ඉතිරිවේ.

(10) මිනිසා විසින් නිර්මාණය කළ භෞතික සම්පතකි.

<u>පහළට</u>


(1) පාසලේ අනන්‍යතාව පිළිබිඹු කරන සංකේතයකි.

(4) ඔබ ප්‍රදේශයේ උත්සව සංවිධානය කරන සමිතියකි.

(6) සාමූහිකව කටයුතු කිරීමෙන් මෙම ප්‍රයෝජනය ලැබේ.

(8) සමාජයේ ජීවත්වීමේ දී බාහිර ආයතනවල මෙන්ම බාහිර ............................. ගේ ද සහය අවශ්‍ය වේ.

(11) සැලසුම් සහගත නොවූ ශිෂ්‍යයාට මෙය ඇතිවේ.




(ල. 11)

**වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව** **දෙවන වාර පරීක්ෂණය 2019**

**06 ශ්‍රේණිය** **පුරවැසි අධ්‍යාපනය**

## I කොටස

01. විශ්‍රාමික විදුහල්පති 02. පාසල් සංවර්ධන 03. සම්පත් ආරක්ෂා කිරීම 04. අලස බව
05. අවස්ථානුකූලව 06. ✓ 07. ✓ 08. ✗ 09. ✓ 10. ✗ 11. 2
12. 3 13. 4 14. 1 15. 2 16. 25 17. ජලය 18. අරපිරිමැස්මෙන්
19. බුද්ධිමය හැකියා 20. මානව ශිෂ්ටාචාරය (2 x 20 = 40)

## II කොටස

01. (1) A ගොවියා, සී සාන්නා B වෛද්‍යවරයා, සාත්තු සේවිකාව
C රියදුරු, කොන්දොස්තර (ල. 04)
(2) ප්‍රයෝජන දැක්වීමට (ල. 04)
(3) 1. වෘත්තීය සුදුසුකම් 2. දියුණුවේ 3. ආර්ථික 4. රටේ සංවර්ධනය (ල. 04)
(4) A ගඩොල්, වළං B මනු කියවන්නා, විදුලි ඉංජිනේරු
C ලී ඉරන්නා, වඩුවා ආදිය D ස්වර්ණාභරණ (ල. 04)
(වෙනත් පිළිතුරුද ඇත්නම් සුදුසු පරිදි ලකුණු දෙන්න.)

02. (1) A පන්ති නායක / නායිකාවන් B ශ්‍රේණි භාර ගුරු ඇවතුන්
C නියෝජ්‍ය විදුහල්පති D විදුහල්පති
E පාසල් සංවර්ධන සමිතිය (ල. 05)
(2) විදුහල්පති - C, D ශිෂ්‍ය ශිෂ්‍යාවන් - A, F අනධ්‍යයන කාර්ය මණ්ඩලය - B, E (ල. 06)

03 (1) 2. උපන්දිනය 4. පෞද්ගලික ලිපිනය 6. දැනුම් දිය යුතු ලිපිනය
8. පාසලේ ලිපිනය 9. පාසලේ දුරකථන අංකය (ල. 05)
(2) 1. අත්දැකීම් මගින් 2. වැඩසටහන් මගින් 3. මාධ්‍ය භාවිතය
4. අත්දැකීම් හා දැනුම මගින් 5. නිර්මාණශීලීව කටයුතු කිරීම තුළින්
6. පොතපත පරිශීලනය මගින් (ල. 06)

04 (1) A කලට වේලාවට වැඩ නිම කිරීමට හුරුවීම.
B ප්‍රධාන කාර්යයන් හඳුනාගැනීම.
C දුර්වලතා හඳුනා ගැනීම.
D සතුටින් වැඩ කිරීම.
E දක්ෂතා හඳුනාගෙන ඉදිරිපත් වීම.
F ක්‍රමානුකූලව වැඩ කිරීම. (ල. 06)
(2) 1. A සමගිය, සහයෝගය, සතුට, එකමුතුබව
B නිරෝගී බව, සතුට, ප්‍රීතිය, උදවු කිරීම
C සතුට, ශරීරය, නිවැරදි ඉරියව් භාවිතය ආදිය (ල. 03)
2. A නිශ්ශබ්දව නොසිටීම / අන් අයට උදව් කිරීම / ඉවසීම
B ජය පරාජය විඳගැනීම / ඉවසීම / ඉරියව් සංයමය ආදිය (ල. 02)

05 (1) 1. සම්පත් 2. සතුටක් 3. සිතේ පීඩාකාරී බව
4. ඇතිවෙයි 5. අවම වෙයි 6. තම අරමුණු (ල. 06)
(2) 1. C 2. B 3. A 4. D 5. E (ල. 05)

06 (1) 1. අම්පාර 2. වයඹ 3. බදුල්ල 4. බස්නාහිර (ල. 04)
(2) 1. මාතර - දකුණ 2. මන්නාරම - උතුරු 3. රත්නපුරය - සබරගමුව (ල. 03)
(3) අදාළ පිළිතුර අනුව ලකුණු දෙන්න. (ල. 04)

07 <u>හරහට</u>
2. පාසල 3. පතල් 5. කොන්ක්‍රීට් 7. රත්නපුරය
9. කාලය 10. ගුවන්තොටුපල
<u>පහළට</u>
1. පාසල් කොඩිය 4. ක්‍රීඩා 6. සුහදත්වය 8. පුද්ගලයන්
11. පසුතැවීම (ල. 11)